

# ජගත් ජේ එදිරිසිංහ

# පිණි

## 10

ආධුනික චිත්‍ර ශිල්පියකු ලෙස කුසල් ගුණරත්න මනා හැකියාවක් පෙන්වා ඇතැයි ඔහුගේ චිත්‍ර නරඹමින් සිටි විශ්වජිත්ට සිතුණි. සැවොම කරන්නා සේ ප්‍රධාන ආරාධිතයා ලෙස දේශපාලනඥයකු ගෙන්වීමේ පිළිවෙතින් මිදී ඒ තැන තමාට දීමට තරම් ශක්තියක් තිබූ තරුණයා කෙරෙහි පැහැදීමක් ඔහුගේ සිතේ ඇතිවී තිබුණේ සිතුවම් නරඹන්නටත් පෙරදී ය. ආධුනිකයකු වුව ද කුසල් චිත්‍රශිල්පියකු ලෙස බොහෝ ඉදිරියට යනු ඇති බවට පෙරමග සළකුණු ඔහුගේ සිත්තම් තුළ සැඟවී තිබෙනු විශ්වජිත් දුටුවේ ය.

ප්‍රදර්ශනයේ තිබූ සිත්තම් අතරින් "ජීවිතය" ලෙස නම් කර තිබූ සිත්තම විශ්වජිත් ගේ සිත බෙහෙවි-න් ඇද බැඳ ගත්තේ ය. ඔහු ඒ ඉදිරියේ බොහෝ වේලාවක් ගත කළේ ය. වේදනාවේ සළකුණු වසා ගන්නට තැත් කරන කාන්තා මුහුණ කැන්වසයක් මත ආධුනික සිත්තරා මවා තිබූ ආකාරය ඔහුගේ සිත් ගත්තේ ය. සිත්තමේ ගැහැණිය ජීවත් වන්නට උත්සාහ දරන්නී ය. අමන්දි සේ ම ජීවත් වන්නට උත්සාහ දරන්නී ය. ඒ උත්සාහය කැන්වසයක් මත සිත්තමකට නගන්නේ කෙසේ ද? ඒ උත්සාහය සිත්තමක වර්ණ රටා අතරට හසු කරගන්නේ කෙසේ ද?

අමන්දි ශ්‍රී ලංකාවට පැමිණ ඇති බව ඇය ඔහුට දුරකතනයෙන් දැන්වූයේ ඊයේ සවස ය. ගමන් වෙහෙස යටපත් කරගත් ඇගේ ප්‍රීතිමත් කටහඬ ඔහු සිතේ මහත් වූ සතුටක් ඇති කළේ ය.

"අපි ඉක්මණට පාඩම් පටන් ගමු..." ඔහු කීවේ ඒ සතුට නොසඟවමින් ය. ඇය සතුටින් සිනාසෙණු ඔහු සිතින් මවා ගත්තේ ය.

"මං හෙට එන්නං ඔයාගෙ ස්ටුඩියෝ එකට..?" ඇගේ උනන්දුව ඔහුට වටහා ගන්නට හැකි ය.

"මහන්සි නැද්ද..? හෙටත් මහන්සි ඇරලා අනිද්දා ඉඳන් එන්න.. අදයි හෙටයි හොඳට නිදා ගන්න.." ඔහු එසේ කීවද ඉක්මණින් ඇය දැක ගන්නට විසල් කැමැත්තක් ඔහු සිත තුළ විය.

ඊයේ සවස් වරුවම විශ්ව ගත කළේ අමන්දිගේ සිත්තම සමගිනි. භාවනාවක යෙදෙන්නාක් මෙන් ඔහු සිත්තමේ සියුම් භාවයන් මතු කරමින් සිටියේ ය. කීපවතාවක් ශාමිලා ඔහුගේ ජංගම දුරකතනයට ඇමතුම් දුන්නද ඔහු එය නෑසුණා සේ සිය භාවනාවේ නිරතව සිටියේ ය. සිත්තමක් හා ඒකාත්මිකව සිටින විට දැනෙන නිරාමිස සුවය ඔහ මහත් ලෝබ කමකින් විඳ ගනිමින් සිටියේ ය.

අද කුසල් ගේ ජීවයෙන් පිරි සිත්තම් අතර සැරිසරද්දීත් විශ්වට දැනෙන්නේ ඒ සුවයම ය.

"වර්ණ මවන්නේ ජීවිතයේ රිද්මයයි. සෑම සැබෑ සිත්තමකට ම ජීවයක් ඇත. ඒ ජීවිතය හඳුනාගන්න. ඒ ජීවිතයට පිබිදෙන්නට ඉඩ දීම සිත්තරාගේ යුතුකමයි." විශ්වජිත් කුසල් ගුණරත්න ගේ "නරඹන්නන්ගේ අදහස්" පොතේ ලිව්වේ ය.

00000

අමන්දි අවදි වන විට දීප්තිමත් හිරු රැස් දහරක් කාමරයේ ජනේල වීදුරුව තුළින් පෙරී විත් ඇගේ ඇඳ මත පතිතව තිබුණි. ඇඳ විට්ටමට කොට්ටයක් තැබූ ඇය ඉහළට ඇදී එහි හිස තබා ගත්තා ය. ජනේලයෙන් එපිට සපත්තු මල් ගසේ අතු අතර දුව පැන සෙල්ලමෙහි යෙදෙන කුඩා කුරුල්ලා මේ ඉරියව්වේදී ඇයට හොඳින් පෙනෙයි. උගේ කිචි බිචි ගීතයද ඇයට හොඳින් ඇසෙයි.

තුරු පත් මත වූ පිණි තවමත් වියැලී නැත. ඒ මත වැටෙන හිරු රැසින් ඒ පිණි බිඳු දිදුලනු අමන්දි බලා සිටියා ය. කොහේදෝ ගුවන් විදුලි යන්ත්‍රයකින් පිරිත් සජ්ජායනයක් ඇසෙයි. ඒ හඬ සිතට සැනසුමක් ගෙන එයි. මේ සුන්දර උදෑසන ඇගේ සිතට සතුටක් මෝදු වෙමින් තිබේ. මේ උදෑසන සේම ජීවිතය ද සුන්දර ය.

අමන්දි ඇඳෙන් නැගිට්ටා ය. ශාරීරික කෙඩෙත්තුව පරයන තරමින් ඇගේ සිත සතුටින් පිරී තිබුණි. ඇය ඉක්මණින්ම ඇඳ ගත්තා ය. පැරිසියෙන් මිලට ගත් සිත්තර ආම්පන්න සහිත බෑගය කරේ දමා ගත් අමන්දි නිමන්ත ගේ කාමරයට හිස පොවා බැලුවා ය. ඔහු තවමත් නින්දේ ය. ඒ නින්දට බාධා කිරීමේ අදහසක් ඇයට නැත .

නිමන්ත අවදි වූයේ අමන්දිගේ මෝටර් රිය පණගැන්වෙන ශබ්දයට ය. කාමරයේ ජනෙල් තිරය මෑත් කර බලන ඔහුට අමන්දි ගේ රිය මහ මගට පිවිසෙන අයුරු පෙනුණි. ඇය යන්නේ විශ්වජිත් හමුවන්නට බව ඔහු දනියි. ඒ ගමනින් ඇයට යහපතක් වනු ඇතැයි ඔහුට සිතුණි. අමන්දිගේ මෝටර් රථය වැලක් සේ එක දිගට ඇදෙන වාහන අතර සැඟවී ගිය පසු ඔහු සුසුමක් හෙළා ආපසු හැරුණේ ය.

000000000000

ශාමිලා කලාගාරයට එන එන විටත් විශ්ව එහි නොසිටියේ ය. කරේ එල්ලා ගෙන ආ ගමන් මල්ල රාක්කයේ තැබූ ඇය තැන තැන ගොඩ ගැසී තිබූ කඩදාසි එක්කර පිළිවෙලකට තැබුවා ය. පොළොවේ පිඟන් ගඩොලු මත දුහුවිලි තට්ටුවක් බැඳෙමින් තිබේ. එසේ වූයේ ඇය පසුගිය දින කීපයේ කලාගාරයට නොපැමිණි නිසාවෙනි. නොපැමිණියේ හිතේ අමාරුව නිසා ය. විශ්වජිත් විසින් තමා නොසළකා හරිනු ලබමින් තිබේය යන පැහැදිළිව පෙනෙන කාරණය ඇගේ සිත තදින් පෙළා දමා ඇත.

පසුගිය දින කීපයම ශාමිලා නිවසින් බැහැරටවත් නොගොසින් කාමරය තුළ ම ගත කළා ය.

"දූට සනීප නැද්ද..?" අම්මා දෙතුන් වතාවක් ම කාමරයට එබී බලා ඇසුවද ශාමිලා එළි පහළියට පැමිණ අනෙක් අය හා ගැවසීමෙන් වැළකී සිටියා ය.

තම සිත පෙළා දමන විශ්වජිත් නම් වන ගුප්ත කලාකරුවා කෙරෙහි බැඳුන අති